# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2280/29 – 2022 මැයි මස 18 වැනි බදාදා – 2022.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදසියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ, බාංඅංග (363) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අමුණුතුඩුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/TMP/2020/290 සහ 2020.11.30 දිනැති පුගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – නාරංඅත්ත – ප්‍රමාණය: හෙක්. 0.0229**

උතුරට: කේ. එම්. ඩී. පී. බී. කුලතුංග හිමිකම් කියන නාරංඅත්ත, කුඹුර සහ අත්කර ගැනීමට යෝජිත පුගමන අනුරේඛන අංක Maha/TMP/2020/269 හි කැබලි අක්ෂර A; නැගෙනහිරට: අත්කර ගැනීමට යෝජිත පුගමන අනුරේඛන අංක Maha/TMP/2020/269 හි කැබලි අක්ෂර A සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ඇළ; බටහිරට: කේ. එම්. ඩී. පී. බී. කුලතුංග හිමිකම් කියන නාරංඅත්ත සහ කුඹුර.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2019/WS/473
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 – 0087

1A – G 36788 – 14 (2022/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*